බුද්ධශාසන අරමුදල - 2016
--------------------------------

බුද්ධශාසන අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම, අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන1990 අංක 35 දරන බුද්ධශාසන අරමුදල් පනතේ 12(4) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 02 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබූ හෙයින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වගන්තිය ප්‍රකාරව, සමාලෝචිත වර්ෂයට අදාල ගනුදෙනු වාර්තාවක් 2018 පෙබරවාරි 16 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2020 ඔක්තෝබර් 07 වන දින ඉදිරිපත් කර ඇති හෙයින්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වගන්තිය ප්‍රකාරව, මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම
--------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම
-------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4** තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ

**2.** මූල්‍ය ප්‍රකාශන

**2.1** තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට බුද්ධශාසන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**2.2.1** ගිණුම්කරණ අඩුපාඩු

බැංකු තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත්වලට අදාල සමාලෝචිත වර්ෂයේ පොළී ආදායම රු.4,407,978 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

**2.2.2** විගණනය සඳහා සාක්ෂි නොවීම

ගිණුම්වල සඳහන් පහත දැක්වෙන එක් එක් අයිතමයන් ඉදිරියෙන් දැක්වෙන සාක්ෂි ඉදිරිපත් කර නොමැතිවීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| | විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (i) | බෞද්ධ ධර්ම ග්‍රන්ථ | 11,605,348 | සමීක්ෂණ මණ්ඩල වාර්තා |
| (ii) | සුනාමි ආධාර | 1,348,796 | විස්තරාත්මක තොරතුරු |
| (iii) | අත්තිකාරම් සහ වෙනත් ලැබිය යුතු මුදල් | 13,031,848 | ශේෂ සනාථ කිරීම් සහ වයස් විශ්ලේෂණ |
| (iv) | ජංගම වගකීම් | 1,712,435 | ශේෂ සනාථ කිරීම් සහ වයස් විශ්ලේෂණ |
| (v) | ස්ථාවර වත්කම් | 10,452,259 | ස්ථාවර වත්කම් ලේඛනය |
| (vi) | වත්කම්ක්ෂය,විකුණුම් සහ ගෙවිය යුතු දීමනා ගිණුම්වලට අදාල මාරු කිරීම් | 3,630,939 | ජර්නල් සටහන් සහ ඊට අදාල වවුචර් |

**3.** මූල්‍ය සමාලෝචනය
-------------------

**3.1** මූල්‍ය ප්‍රතිඵල
-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු. 25,852,041ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.27,945,573 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,093,532 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ආයෝජන පොලී ආදායම ඇතුළුව මුළු අයභාරය රු.634,813 කින් අඩුවීම සහ වියදම රු.2,728,345 කින් වැඩිවීම මෙම පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි

**4.** මෙහෙයුම් සමාලෝචනය
-----------------------

**4.1** කාර්යසාධනය
---------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී රු.35,038,436 ක් අරමුදලේ ආදායම් ලෙස ලැබී තිබුණ ද එයින් රු.9,186,395 ක් එනම් සියයට 26 ක් පමණක් අරමුදලේ අරමුණු වෙනුවෙන් වැයකර තිබුණි. තවද, වාර්ෂිකව අතිරික්ත වන මුදල් ආයෝජනය කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුළු ආයෝජන වටිනාකම රු.483,767,200 ක් විය. බුද්ධ ශාසනය ආරක්ෂා කිරීම හා පෝෂණය කිරීම අරභයා ඉතාමත් යෝග්‍ය කාර්යයන් සඳහා මුදල් යෙදවීම අරමුදලේ කාර්යභාරය වුවද, වාර්ෂිකව අරමුදලට ලැබෙන ආදායමට සරිලන අන්දමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අරමුදල අපොහොසත් වී තිබුණි.

(ආ) අරමුදලට අයත් අනුරාධපුර බසවක්කුලම ප්‍රදේශයෙහි පිහිටි අක්කර 2 රූඩ් 01 පර්චස් 13 කින් යුතු ඉඩම හා එහි ඉදිකර ඇති ගොඩනැගිලි 1994 අගෝස්තු 15 දින සීමාසහිත ශ්‍රී අනුරාධපුර අමද්‍යපාන සංග්‍රහ සමිතිය වෙත රු.50 ක වාර්ෂික බදු කුලියකට බදු දී තිබුණි. බදු ගිවිසුමෙහි (ග) වගන්තිය ප්‍රකාරව බදු ගත් ඉඩම පිහිටි ප්‍රදේශයේ පළාත් පාලන ආයතනය නොහොත් නගර සභාව හෝ පළාත් සභාව හෝ ප්‍රදේශීය සභාව හෝ විසින් කරනු ලබන වාර්ෂික ඉඩම් තක්සේරුවද අන් සාධක ද සලකා බලා බදු කුලිය ප්‍රතිශෝධනය කිරීමේ බලය බදු දීමනාකරුට ඇති අතර 2014 වර්ෂයේ තක්සේරු වාර්තාව අනුව මෙම දේපළවල වෙළෙඳපොල වටිනාකම රු.10,500,000 ක් ලෙස දක්වා තිබුණ ද, බදු කුලිය ප්‍රතිශෝධනය කිරීම සම්බන්ධයෙන් අවධානය යොමුකර නොතිබුණි.

**5.** පද්ධති හා පාලන
-----------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පිළිබඳව වරින්වර අරමුදලේ ලේකම්වරයා දැනුවත් කරන ලද අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) අරමුදල් ආයෝජනය හා උපයෝජනය

(ආ) ගිණුම්කරණය

(ඇ) අරමුණු අනුව කාර්යසාධන මට්ටම

(ඈ) අයවැය ලේඛනමය පාලනය